# බසක වරුණ

## සිංහල භාෂා දිනය

### සිංහල භාෂා දිනය ආශ්‍රිත තරඟ මාලාව

සිංහල භාෂාව ප්‍රචලිත කිරීමට මෙන්ම එයට හිමි ශක්තීන් හඳුන්වාදීම අරමුණු කරගත් භාෂා භාවිතය ආශ්‍රිත තරඟ මාලාවක් සංවිධානය කෙරෙන අතර ජයග්‍රාහකයන්ට වටිනා ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කෙරේ. මෙම තරඟ මාලාව ළමා සහ වැඩිහිටි යන කාණ්ඩ දෙකකින් පැවැත්වෙන අතර ළමා කාණ්ඩයට අවුරුදු 5 සිට අවුරුදු 16 දක්වාත් (උපන් දිනය 1995 අප්‍රේල් 08 දිනට පෙර) වැඩිහිටි කාණ්ඩයට අවුරුදු 16 ට ඉහළ වශයෙනුත් අයත්වේ. ඔන්ටාරියෝ ප්‍රාන්තයේ ජීවත් වන ඕනෑම කෙනෙකුට මෙම තරඟය වලට ඇතුලත් විය හැකිය.

ජයග්‍රාහී ලිඛිත නිර්මාණ ඇතුලත් ග්‍රන්ථයක් සම්පාදනය කිරීමටත් භාෂා දින කමිටුව සැලසුම් කර තිබේ.

### පැවැත්වීමට නියමිත තරඟ

කවි
කෙටි කතා
රචනා
ජන ගායනා
පරිඝණකයක් ආධාරයෙන් සිංහල අකුරු පරිච්ඡේදයක් ටයිප් කිරීම

ඔබගේ කවි, කෙටි කතා, රචනා සහ ජන ගායනා මාර්තු මස 30 වන දිනට ප්‍රථම Sinhala Language Day, Consulate General of Sri Lanka, 40, St Clair Avenue West, Suite 405, Toronto, ON M4V 1M2 යන ලිපිනයට තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදීමෙන් හෝ sinhalalc@gmail.com යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් හෝ ලැබෙන්නට සලස්වන්න.

කවි සහ කෙටිකතා සඳහා තමන් කැමති ඕනෑම තේමාවක් යොදා ගත හැකි අතර රචනා සඳහා ඒ ඒ වයස් ඛාණ්ඩ සඳහා නියම කර ඇති පහත සඳහන් තේමාවන්ගෙන් එකක් භාවිතා කළ යුතුය.

### ළමා (වචන 1000 කට නොවැඩි)

1. මා කැමති ශ්‍රී ලංකාව
2. හෙට දවස වෙනුවෙන් පරිසරය සුරකිමු.
3. ජාතික සමගිය
4. මා වැඩිහිටියකු වූ පසු
5. මා කැමතිම පොත, චිත්‍රපටය, ක්‍රීඩාව, ගීතය හෝ නාට්‍යය

### වැඩිහිටි (වචන 1500 කට නොවැඩි)

1. ධර්මය අනුව හැසිරෙන්නා ධර්මය විසින් රකිනු ලබයි.
2. ජාතික සමගිය ඇති කර ගත හැක්කේ කෙසේද?
3. වර්තමාන ශ්‍රී ලංකාව යායුතු මග
4. සිංහල භාෂාව ප්‍රගුණ කළ යුත්තේ ඇයි?
5. ගැටුමෙන් තොර ලෝකයක් තනා ගැනීම උදෙසා මානව සංහතියේ වගකීම

ජන ගායනා සීඩී තැටියකින් හෝ විද්‍යුත් තැපෑලෙන් එවිය හැක. කාලය විනාඩි 4කට නොවැඩි විය යුතු අතර සංගීතයෙන් තොර විය යුතුය. ජයග්‍රහකයින් තෝරා ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රවීණ සංගීතඥයෙකු වන රෝහණ බැද්දගේ මහතා ප්‍රමුඛ විනිශ්චය මණ්ඩලයක් විසිනි.

පරිඝණකයක් ආධාරයෙන් අඩුම කාලයක් ඇතුලත සිංහල අකුරු පරිච්ඡේදයක් නිවැරදිව ටයිප් කිරීමේ තරඟය සඳහා ඔබගේ ක්වචිදව පරිඝණකය භාවිතා කල හැකි අතර යුනිකෝඩ් හෝ ඕනෑම සිංහල අකුරු සහිත මෘදුකාංගයක් යොදා ගත හැක. මේ සඳහා මාර්තු 26 වෙනි දින උදේ 9.00 ට ටොරොන්ටෝ මහා විහාරයට පැමිණ ලියාපදිංචි වන්න. තරඟය දවල් 12 දක්වා පැවැත්වෙන අතර ලියාපදිංචි වන පිලිවෙලට පැවැත්වේ. (අවශ්‍යතාවය අනුව පරිඝණකයක් සැපයිය හැකිය. තරඟ දිනට සතියකට පෙර දැනුම් දෙන්න)

පහත සදහන් විස්තර පුරවා ඔබගේ නිර්මාණයත් සමග ලැබෙන්නට සලස්වන්න.

නම : ..........................
උපන් දිනය : ..........................
වයස : ..........................
ලිපිනය : ..........................
දූරකථන අංකය : ..........................
විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................

මෙම නිර්මාණය මගේම නිර්මාණයක් බවට සහතික කරමි.

අත්සන: ......................

වයස අවුරුදු 5 සිට අවුරුදු 16 දක්වා අයදුම්කරුවන් සදහා පමණයි.

මෙම නිර්මාණය .............................. නිර්මාණයක් බවටත් ඉහත සදහන් කරුනු නිවැරදි බවටත් සහතික කරමි.

මව/පියා/භාරකරුගේ නම:

අත්සන: ......................